# රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## **SLS 4202** – සිංහල කාව්‍ය ශිල්පය

**පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**(නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)**

කාලය : පැය 03

---

01. පහත දැක්වෙන ගී පාය වත්මන් ව්‍යවහාර සිංහලයට නගන්න.

(අ) අන් දහමක් අනෙක් - තැනෙක්හී ලෝ වැටුමෙන්,
මොනවට පිහිටුවත් හොත් - සමාදිය යෙත් හෙ මෙසේ.

කුමුදු නිදා පියුම් වෙනෙ - පුබුදු වේ වියුමෙන්,
මෙනෙත් කිරිය දැරීමෙන් - කියන වදන් සුලබ වේ.

(සියබස්ලකර විස්තර වර්ණනාව)

(ආ) වසම්හි අටමත් - සමපෙදේ ඇර තුදුරෙන්,
මතෙක් හළිති බඳුයේ - පියුම් නම් වේ හෙ මෙසේ.

වසමැ අට දස මත් - සෙමෙහි දු ඇර තෙළෙසින්,
ගෙතු බහල් මත්නෙන් - බමර ගී නම් හෙ මෙසේ.

(එළු සඳැස් ලකුණ)

(ඇ) පද සසඟින් හොත - බෙදුමෙන් හොත අතින් හෝ,
හුණත'නිටු ගැමි අරුත් - එ විරුදු අරුත් දොස් නම්.

පෙරැ පිළිවෙළ යෙදි - පසු පෙදෙ ඉකුත් වී නම්,
එ උපිළිවෙළ නම් දොස් - පැවසූ පදී පඬුවෝ.

(සිදත් සඟරා විවරණය)

(ඈ) වැර කරනුයේ - සිතැ
උසා උපදවනුයේ -
වැරුරු නමි. වැකියේ
එ රස සිතු වැර වඩයි.

තෙපි හැම දෙන මැ එවු.
තනි මා පස්සට පිය
අඟලකුදු ගතොත්
සමනොළ ද කොළඹ එයි. (විරිත් වැකිය)

(ලකුණු 24 යි)

265

02. ඡන්දස යනු කුමක් දැයි කෙටියෙන් පහදා වර්ණ ඡන්දස නිදසුන් දෙමින් විස්තර කරන්න.

03. ඡන්දස් ශාස්ත්‍රයට අයත් ලුහු-ගුරු න්‍යාය එළු සඳැස් ලකුණ ඇසුරෙන් විග්‍රහ කොට, ගී විරිත් භාවිතයෙහි ලා එහි ඇති උපයෝගීතාව පිළිබඳ විස්තරයක් සපයන්න.

04. **යොන් ගී, කාරිකා ගී** සහ **යහ ගී** නමැති ගී විරිත් තුන නිදසුන් සපයමින් විස්තර කරන්න.

05. “ගවඟන වේ පසස් - නදා බස් කැරැ සකස්,
පියසුවහට අන්හට - ගව බව් මෙ හුදු සාදා.”
සියබස්ලකරෙහි එන මේ ගීයෙන් කාව්‍ය විෂයෙහි භාෂා භාවිතය පිළිබඳ කවර කරුණු හෙළි වේ දැයි පහදන්න.

06. **මාධූර්ය, අර්ථව්‍යක්ති** සහ **උදාර** යන මේ කාව්‍ය ගුණත්‍රය පිළිබඳ ව සනිදර්ශනාත්මක විග්‍රහයක යෙදෙන්න.

07. “සියලු පටනැ මැදැ අවසනැ වත ගලන
එ මනබයජරසත නමින’ට ගණ වන
දියො’ද සෙතා’ ලෙඩ දළ සෝ මර වැසන
පටන’බිදන් පසැ සිටුවා කළ කෙමෙන.”
සිදත් සඟරාවෙ එන මෙ උද්ධෘතය ඇසුරු කරමින් සිංහල පද්‍ය කාව්‍යයන්හි ගණ පිහිටුවීමේ ක්‍රමවේදය නිදසුන් දක්වමින් පහදන්න.

08. “කුමාරතුංග මුනිදාසයන්ගේ ‘විරිත් වැකිය’ වනාහි සිංහල පද්‍ය කාව්‍යයේ ශිල්පීය ලක්ෂණ පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයකි.” මේ අදහස පිළිගත හැකි දැයි පරීක්ෂා කරන්න.

(අංක 02 සිට 08 දක්වා පිළිතුරුවලට ලකුණු 14 බැගිනි.)

@@@@@@@@@